# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024

**11 ශ්‍රේණිය**

## නර්තනය - II

නම/ විභාග අංකයඃ ......................................... කාලය ;- පැය 2

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමි වේ.**

01)

i. ප්‍රශස්ති කාව්‍ය වඩාත් ම ජනප්‍රිය වී ඇත්තේ ..................................... යුගයේ දී ය.

ii. වේගයෙන් භ්‍රමණය වන අඟපසඟින් යුත් ලෝකඩ නළඟන රූපයක් අනුරාධපුර ................................ පොකුණ අසලින් හමු වී ඇත.

iii. දෙවියන්ට ආරාධනා කිරීම හා ආශිර්වාදය ලබා ගැනීමේ අරමුණින් ....................... වාදනය කරයි.

iv. කෝලම් නාටකයේ මරු රාක්ෂ, නාග කන්‍යා වැනි නර්තන ...................... චරිත ලෙස හැඳින්වේ.

v. අංග, ප්‍රත්‍යාංග, උපාංග ලෙස .................... අභිනය කොටස් තුනකට වර්ග කර දක්වයි.

vi. ............... කව්වල සඳහන් අන්දමට පත්තිනි දෙවියන්ගෙන් අවසරගෙන නර්තනය ආරම්භ කරන බවයි.

vii. ගොයම් කැපීමේ නර්තනය නිර්මාණකරු වන්නේ ................. මහතා ය.

viii. දේවදාසීන් හත්දෙනෙක් පිදූ බව .................... සෙල්ලිපියේ සඳහන් වේ.

ix. සිව් වැදෑරුම් අභිනය පිළිබඳ තොරතුරු දැක්වූ භාරතීය පඬිවරුන් දෙදෙනා වන්නේ
1. .....................................  2. .....................................

x. පහත සඳහන් සිදුවීම්වලට අදාළ වර්ෂ දක්වන්න.
1. රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ ලංකාගමනය සිදුවූයේ ......................................
2. අ.පො.ස. (උ/පෙළ) සඳහා නර්තන විෂය ඇතුළත් කිරීම ......................................

(ලකුණු 12)

02)

i. මාත්‍රා 4+4 තාල රූපයට බෙර පදයක් ප්‍රස්තර කරන්න.

ii. "රනේ රුවසේ වත රුවින් දිලේ දෝ" යන කවි පදය මැදුම් තනි තිතට ප්‍රස්තාර කරන්න.

iii. සැවුලා වන්නමේ කස්තිරම ප්‍රස්තාරගත කරන්න.

03) පහත මාතෘකා අතරින් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. ග්‍රහ පන්ති කවි

ii. සින්දු වන්නම්

iii. මිරන්ඩා හේමලතා මහත්මිය

iv. කුඹී කතාව

v. ගැමි නැටුම්

04) දේශීය ශාන්තිකර්ම වූ කලී ලාංකීය නර්තන කලාවේ අනන්‍යතා ලක්ෂණ පිළිබිඹු කරයි.

i. පහන් මඩු ශාන්තිකර්මය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු දෙක බැගින් දක්වන්න.

ii. දෙවොල් මඩුවේ නර්තනාංග හතරක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

iii. කොහොඹා කංකාරි කතා පුවතෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පිළිබඳ සාකච්ඡා කරන්න.

05)

i. සොකරි නාටකයේ ප්‍රචලිත ප්‍රදේශ හතරක් නම් කරන්න.

ii. සොකරි රඟමඩල ගැන කෙටියෙන් විස්තර කරන්න.

iii. සොකරි හා කෝලම් නාටකවල වෙනස්කම් හතරක් කෙටියෙන් දක්වන්න.

06)



A



B



C

i. A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදය නම් කර එම නර්තන සම්ප්‍රදයේ නර්තනාංග තුනක් නම් කරන්න.

ii. B රූපයේ නර්තන සම්ප්‍රදය නම් කර එහි සංගීත සම්ප්‍රදය හා වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු දක්වන්න.

iii. C නර්තන සම්ප්‍රදය නම් කර එහි වේෂනිරූපණය පිළිබඳ විස්තර කරන්න.

07)

i. නර්තනය හැදෑරීමෙන් අත්පත් කරගන්නා යහපත් ගුණාංග හතරක් නම් කරන්න.

ii. අධ්‍යතන නර්තන නිර්මාණ තුළ භාවිත තාක්ෂණික ක්‍රම ශිල්ප හතරක් නම් කරන්න.

iii. සාම්ප්‍රදයික නර්තන නූතන වේදිකාව තුළට ගෙන ඒමේදී සිදුවී ඇති වෙනස්කම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.